**රාජාංගනය ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**----------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ** විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 21 දින සභාපතිවරයා වෙත යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට රාජාංගනය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**----------------------------------------**

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 වර්ෂයේ ඉදිකිරීම් නිම කරන ලද ජල ව්‍යාපෘතියේ හා සතිපොල ගොඩනැගිල්ලේ පිරිවැය රු.7,674,230 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණු බැවින් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ අනුව වෙන්දේසි කිරීමට නියම කර තිබූ 5 කණුව සතිපොල පැරණි ගොඩනැගිල්ලෙන් කඩා ඉවත් කර තිබූ ද්‍රව්‍යවල පිරිවැය ගිණුම්වලින් ඉවත් කරනු වෙනුවට වෙන්දේසි වටිනාකම වූ රු.109,750 ක් ගිණුම් වලින් ඉවත් කර තිබුණි.

(ඇ) ස්ථාවර වත්කම් යටතේ දක්වා තිබුණු එකතුව රු.1,106,177 ක් වූ වත්කම් ඒකක 20 ක් විවිධ අවස්ථාවල ඉවත්කර තිබූ නමුත් එම ඉවත් කිරීම් ගිණුම්වලට ගැලපීම් කර නොතිබුණි.

(ඈ) රු.28,500 ක් වූ GI බට 20 ක් යන්ත්‍ර උපකරණ යටතේ හා කාර්යාල උපකරණ යටතේ දෙවරක් ගිණුම්ගතකර තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුම වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) පොදු ගබඩා ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙනවිත් තිබූ රු.666,656 ක තොග සමාලෝචිත වර්ෂයේ දී භාවිතාකර තිබුණද එය වියදමක් ලෙස හඳුනාගෙන නොතිබුණු බැවින් වර්ෂයේ අතිරික්තය හා තොග එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) 2018 වර්ෂය සඳහා ලබාගෙන තිබුණු රු.153,694 ක තැන්පත් මුදලක් සමාලෝචිත වර්ෂයේ කුලී ආදායමක් ලෙස ගිණුම්ගතකර තිබීමෙන් අතිරික්තය එම වටිනාකමෙන් වැඩියෙන් හා ආපසු ගෙවිය යුතු තැන්පත් එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) ඉකුත් වර්ෂවලට අදාලව 2018 වර්ෂයේ දී ලැබී තිබුණු රු.14,106,147 ක උසාවි දඩ සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස හඳුනාගැනීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) මාර්ග සතිය ව්‍යාපෘතිය වෙනුවෙන් වූ ප්‍රාග්ධන වියදම් රු. 819,423 ක් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ වියදම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. එම වියදම පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය විය යුතු නමුත් ලැබිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීම හේතුවෙන් ජංගම වත්කම් එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) සභාවේ වැසිකිලි පද්ධතිය ඉදිකිරීමට වැයකරන ලද එකතුව රු. 615,932 ක් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ වියදම් වැඩියෙන් ද ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුම එම වටිනාකමෙන් අඩුවෙන් ද දක්වා තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවක ඇප තැන්පත් ගිණුම්වල ශේෂය රු.43,154 ක් වුවත් එය රු.11,539 ක් ලෙස දැක්වීම නිසා ජංගම වගකීම් රු.31,615 කින් අඩුවෙන් දක්වා තිබුණ

1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙනඑමින් පවතින එකතුව රු.2,374,837 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 8 ක් හා එකතුව රු.1,720,536 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 07 ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය තුල කටයුතු කර නොතිබුණි. මෙම ශේෂයන්ගේ කාල විශ්ලේෂණයන් හා ශේෂ තහවුරු කර ගැනීමට අවශ්‍ය විස්තර සභාව සතුව නොතිබුණි.

1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

-------------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 72,857,904 ක් වූ ගිණුම් විෂයන් 03 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.4 නීතී ,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

-----------------------------------------------------------------------------

නීතී ,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීතී ,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | | | වටිනාකම | අනුකූල නොවීම |
| --- | --- | --- | --- | --- |
| (අ) | 1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | රු. | |
| | (i) | රීති 174 | | දෙපාර්තමේන්තුමය වශයෙන් ඉටු කරනු ලබන වැඩ ඉටු කරන අවස්ථාවන්හිදී, ඒ ඒ වේටය සම්බන්ධයෙන් යොදවනු ලැබූ කම්කරු පිරිස පිළිබඳ වෙක් රෝලක් හෝ බෙදාහැරීම් ලේඛනයක් පවත්වා ගෙනගොස් නොතිබුණි. |
| | (ii) | මූල්‍යරීති 261.2.2 | 12,320 | පෙර පාසැල් සඳහා ද්‍රව්‍ය ලබාදීමට ලබාගත් රු.50,000 කින් රු.12,320 ක් අදාල කාර්යයෙන් පරිබාහිර කාර්යන් සඳහා වැයකර තිබුණි. |
| (ආ) | සභාවේ වාර්ෂික බලපත්‍ර ගාස්තු පැනවීමට අදාල අංක 1993 දරන 2016 නොවැම්බර් 11 දිනැති ගැසට් පත්‍රය | | 512,150 | ව්‍යාපාර බදු යටතේ ගැසට් කර නොතිබූ ව්‍යාපාර 253 කින් ගැසට් පත්‍රයේ ගාස්තු වලට අනුකූල නොවන ලෙස ගාස්තු අයකරගෙන තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,779,625 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,816,875 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

-----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

----------------------------------------------------------------

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ බිල්කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය | 2017 වර්ෂයේ බිල්කල ආදායම | 2017 රැස්කළ ආදායම | | 2017 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ආදායම |
|---|---|---|---|---|---|
| | | | 2017.01.01 හිඟය | 2017 බිල්කළ මුදලින් | |
| | වටිනාකම | වටිනාකම | වටිනාකම | වටිනාකම | වටිනාකම |
| | රු. | රු. | රු. | රු. | රු. |
| බලපත්‍ර ගාස්තු | - | 79,000 | - | 79,000 | - |
| කඩ කාමර කුලී | 17,000 | 807,000 | 17,000 | 778,200 | 45,500 |
| ටෙන්ඩර් බදු | - | 461,200 | - | 461,200 | - |
| පොල ගාස්තු | - | 2,991,500 | - | 2,991,500 | - |
| ව්‍යාපාර බදු | - | 568,000 | - | 568,000 | - |
| කර්මාන්ත බදු | - | 444,500 | - | 444,500 | - |
| පරිසර බලපත්‍ර | - | 93,200 | - | 93,200 | - |
| එකතුව | 17,000 | 5,444,400 | 17,000 | 5,415,600 | 45,500 |

2.2.2 වරිපනම් හා බදු

----------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (i) වගන්තිය ප්‍රකාරව සංවර්ධනය කරන ලද ප්‍රදේශ නම්කර එම ප්‍රදේශවල ඉඩම් වටිනාකම තක්සේරු කර වරිපනම් බදු අයකිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

2.2.3 උසාවි දඩ

-------------

සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු උසාවි දඩ රු.14,734,221 ක් විය.

2.2.4 මුද්දර ගාස්තු

----------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් සභාවෙන් අයවිය යුතු මුද්දර ගාස්තු වටිනාකම රු. 1,080,426 ක් විය.

2.2.5 වෙනත් ආදායම්

-------------------

සභා බල ප්‍රදේශයේ පිහිටි දැන්වීම් පුවරු ලේඛනගත කර ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

3.1 කාර්යසාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා, විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

---------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වුවත් උතුරු මැද පළාත් සභාව මගින් 2016 මාර්තු 30 දින ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද අංක 1960/35 දරන අතුරු ව්‍යවස්ථාව සභාව වැළඳගෙන ඇති බව 2017 දෙසැම්බර් 22 දිනැති අංක 2051 දරන ගැසට් පත්‍රය මගින් පලකර තිබුණු නමුත් එම අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

--------------------

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2014 පෙබරවාරි 17 දිනැති 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

----------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යායපත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණු බැවින් එහි දක්වා තිබුණු අරමුණු ඉටු කර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ). ස්ථාවර වත්කම් විෂයයන් 05 කට අදාල උපලේඛනයේ දැක්වෙන ප්‍රමාණය හා ස්ථාවර වත්කම් ලේඛනයේ දැක්වෙන ප්‍රමාණයන් අතර වත්කම් ඒකක 25 ක පවතින වෙනස නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ). වෙන්දේසි කරන ලද එකතුව රු. 41,350 ක් වූ වත්කම් ඒකක 4 ක් අදාල උපලේඛනවලින් ඉවත් නොකර දිගින් දිගටම ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ඇ). 1988 වර්ෂයේ සිට අත්පත්කරගෙන තිබුණු ලී බඩු උපකරණ වෙන් වෙන්ව හඳුනාගත හැකිවන පරිදි ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව නඩත්තු කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

4.1 අයවැය පාලනය

------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයවැය සැකසීමේදී ආදායම් හා වියදම් නිසි පුරෝකථනයක් සිදු නොකිරීම හේතුවෙන් ආදායම් විෂයන් 05 ක අයවැයගත ආදායම හා තත්‍ය ආදායම අතර සියයට 33 සිට සියයට 1,147 දක්වා වූ පරාසයක විචලනයක් හා වැය විෂයන් 06 ක අයවැයගත වියදම හා තත්‍ය වියදම අතර සියයට 32 සිට සියයට 308 දක්වා වූ පරාසයක විචලනයක් වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොමැති බව නිරීක්ෂණය විය.

4.2 අභ්‍යන්තර විගණනය

-------------------------

උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ 2015 මාර්තු 18 දිනැති අංක 04/2015 දරන චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර තිබුණද අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු

----------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(1) දරන කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයට අනුව 2017 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

5 පද්ධති හා පාලනය
---------------------
විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි තවදුරටත් විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | නිවැරදිව ලේඛනගත නොකිරීම. |
| (ආ) | තොග | (i) වර්ෂයේ ආරම්භක තොග හඳුනා නොගැනීම.<br>(ii) හඳුනා නොගත් තොග ශේෂ පැවතීම. |
| (ඇ) | ණයගැති හා ණයහිමි | (i) උපලේඛන පිලියෙළ නොකිරීම.<br>(ii) කාල විශ්ලේෂණ පිලියෙළ නොකිරීම. |
| (ඈ) | ව්‍යාපෘති | ප්‍රමාණවත් අධීක්ෂණයක් නොතිබීම. |
| (ඉ) | ගිණුම්කරණය | පොදු ලෙජරය තුලනය නොකිරීම. |
| (ඊ). | ආදායම් | (i) අතුරු ව්‍යවස්ථා පනවා නොතිබීම.<br>(ii) වරිපනම් අයකිරීමට කටයුතු නොකිරීම.<br>(iii) සභාව සතු කුලී දේපල තක්සේරු කර නව කුලී අය නොකිරීම.<br>(iv) දැන්වීම් පුවරු ලේඛනයක් සකස් නොකිරීම.<br>(v) දැන්වීම් පුවරුවලින් ආදායම් අය නොකිරීම. |